# දකුණු පළාතේ විශ්‍රාන්තිය ගෙනහැර පෑ අපේ ගම

ආර්. එම්. සී. ඒ. සේනානායක

මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත ''අපේ ගම'' නම් කෘතියේ ඔහුගේ කුඩා කල එක් කාලවකවානුවක් හා එකල ඔහු ජීවත් වූ ගම් ප්‍රදේශය ගැන විස්තර කරයි. මෙහි කතුවරයා හා ඔහු වටා සිටි පිරිස එකල විවේක කාලවලදී හා විනෝදාස්වාදය උදෙසා කල කී දෑ දේ පිළිබඳව ද සඳහන් වේ. අපූරු ගමක ස්වභාව සෞන්දර්‍යත්වය විඳිමින් ඔවුහු විශ්‍රාන්තිය උපරිමයෙන් භුක්ති විඳ ඇති බව පෙනේ. මෙම ග්‍රන්ථයෙන් උපුටා ගත් එම අවස්ථාවන් කිහිපයක් පහත දැක්වේ. මෙමඟින් ඔවුන්ගේ විශ්‍රාන්තිමය අවස්ථා හඳුනාගත හැකිය.

වන රොද ඉදිරියෙහි වූ සුදු වැලිතලායෙහි, වටින් අඩි හාර සියයක් පමණ වන කිරි - ගොටුවක් වැනි වළක් වෙයි. වර්ෂා සමයෙහි දිය පිරුණු විට ඒ වළ කුඩා අප පොවන තරම් ගැඹුරු ජලාශයකි. කෙහෙල් පිත්තෙන් සැදු ඔරු, ඉරටු කැලිවල ඇවුණු රුවලින් ඒ දිය වළෙහි පා කිරීම, අපට එකල අපමණ ප්‍රීතියක් ගෙන දුන් කෙළියකිනදී තීරයට පිවිසීම පිණිස, එබමුදු, වල් බෙලි, මිදෙල්ල, සූරිය යන ආදී ගසින් සෙවණ වූ පැළඉනි දෙවැටක් මැදින් වැටුණු පටු පාරක් ඔස්සේ අපි ගමන් කළෙමු. කුඩා මලින් සැරසූ රැහැන් පටවල් සේ මැයි මාසේ මිදෙල්ල ගස්වලින් එල්ලෙන මල් වැල් වටා පියාඹන මී මැසි කැලගේ නාදය ද ඇසිය හැකි ය. 'මිදෙල් මෙවුල් දම්' යනු විසින් සසදාවත් කාරයෝ මිදෙල් මල් මෙවුල් දම් වැන්නැයි කීවෝ යී' කිණිහිරි මල්වල පාට ද ඇති සූරිය මල අප සිත් නොගත් නමුත්, සූරිය ගෙඩි අප සිත් ගත්තේ ය. සූරිය ගෙඩි ඉරටු කැබෙලිවල දෙකොන්හි ගැසීමෙන් සාදාගන්නා සෙල්ලම් කරත්ත, නූල් පටින් බැඳ ඇදගෙන යන ළමයින් දකින්නට ලැබෙන්නේ කලාතුරකින් නොවේ.....අප නදී තීරය බලා යන විට ඇතැම් දවසක, සෙක්කු පැදීමට ද ටික වේලාවක් ගත කරන ලදී. බර වැඩි වීමෙන් සෙක්කුවට හානි වේය යන බියෙන් සිටින සිඤ්ඤෝ අයියා (මේ සෙක්කුකාරයාගේ නමයි) නොයෙකුත් බොරු ඇද බැමෙන් අප එළවීමට තැත් කරයි. සමහර විට, හෙතෙම, ජය ගනියි. සමහර විට ඔහුගේ තර්කයට හෝ ආයාචනයට හෝ කන් නොදී, ටික වේලාවක් සෙක්කු පැද යාම අපගේ සිරිත විය....නදී තීරයට යන විට, කොටුවට ඇතුළු වී උක් ගසක් දෙකක් කපාගෙන ගොස්, නදී තීරයෙහි කිරල ගසින් සෙවණ වූ විශාල ගලක් උඩට වී, මාළු මරන්නන් මාළු බානු බලමින් උක් ගස් කෑලි විකීම, අපගේ එක් වන භෝජනයක් වී ය....අප වාඩි වී උන් පර්වතය එල්ලේම වූ අනෙක් පැත්තේ නදී තීරයෙහි වූ කුඩා කඳු ගැටයක පිහිටි විහාරයක් වෙයි. බත්තලයකින් යාත්‍රා කිරීම විනෝද ක්‍රීඩාවක් බැවින්, අප පමණක් නොව, වැඩිහිටි සහෝදරයෝ ද සහෝදරියෝ ද, මේ විහාරය වැඳීමට යන්ට ඉතා කැමැත්තෝ ය. කුඩා අප විහාරය වැඳීමට ගියේ ගඟේ යාත්‍රාවට ආශා කළ බැවිනි. ඒ විහාර භූමියෙහි කදිම අඹ වනයක් වෙයි. වාරයෙහිදී අඹවලින් බරවීමෙන් බිමට නැමුණු අතු ඉති මේ අඹ ගස්වලින් අඹ කඩා ගැනීමේ ආශාවෙන් ද, මේ විහාරස්ථානයට අයත් අඹ ගස්වලින් අඹ කඩා ගන්නේ මුදල් ගෙවීමෙන් පසු වුව ද අප කඩන්නේ මුදල් ගෙවීමට පෙර ය.

අතු-ඉති නමා වැටෙන තෙක්, පැසුණු අඹවලින් බර වූ අඹ ගස් දුටු අපට, මෙදින අඹ ටිකක් සොරෙන් වුව ද කඩා ගැනීමට සිතිණ. අප තිදෙන ගලින් බැස මාළු බාමින් සිටි තරුණයා ද සමඟ කුඩා ඔරුවක නැඟ එගොඩට යාත්‍රා කළෙමු. කුණාටු සහිත දවසක් වුව ද එය නොසලකා යාත්‍රා කොට නදිය මැද දී අන්තරායකට හසු වූ අපට ඒ ද සෙල්ලමක් වී ය. කුණාටුවකට හසු වීමෙන් ඔරුව ඒ මේ අත හැලහැප්පෙන්නට වූයෙන්, අපේ කාංඩයේ එකෙක් බිය වී හදිසියේ නැඟී සිටියේ ය. ඔහු නැඟී සිටිත්ම. ඔරුව පදිමින් උන් තරුණයා ''වාඩිවෙන්න! වාඩිවෙන්න! ඔරුව පෙරළෙයි!'' කියා කෑ ගැසී ය. නැඟී සිටි මගේ මිත්‍රයා වාඩි වන්ට පෙර කොල්ලෑව ඉස්සී ඔරුව පෙරළිණ. බිළිකාර තරුණයා පීනිමෙහි සමර්ථ තරුණයා වහා පීනා ගොස් ඔරුව අල්ලා අපට ළං කළේ ය. අපි ඔරුවේ එල්ලී නොබෝ වේලාවකින් ඔරුව උඩට නැඟ ගතිමු... ඇතැම් දවසක අප කළ එක් සෙල්ලමක් නම් 'සුරන් ගැහීම' යි. පාසැල පිහිටියේ, ලොකු කුඩා ගලින් ද සීන් කැටින් ද ගැවසීගත් කන්දකට නගින තැන ය. එබඳු තැනක වූ පිටියක සුරන් කෙළිය වනාහි, ගල් ගොඩක් උඩ පිනුම් ගැහීම මෙන් අන්තරායකර යයි වැඩිහිටියන්ට වැටහුණ ද, කුඩා අපට නොවැටහිණි.

මේ අනුව මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත ''අපේ ගම'' නම් කෘතියේ ඔහුගේ කුඩා කල එක් කාලවකවානුවක් හා එකල ඔහු ජීවත් වූ ගම් ප්‍රදේශය තුලින් ඔවුන් තුල පැවති විශ්‍රාන්තිමය අවස්ථා හඳූනාගත හැකිය.

මාර්ටින් වික්‍රමසිංහ :2007*,අපේ ගම, සී/ස. සරස (පුද්) සමාගම, රාජගිරිය.